මගේ අංකය - ජේඑස්සී/ඊජ්/ස්ථානමාරු 2023

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිශ්චයකාරවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්,

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ වාර්ෂික ස්ථානමාරු – 2022 යටතේ අත්හිටුවන ලද ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම.**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ වාර්ෂික ස්ථානමාරු 2022 යටතේ ස්ථානමාරු ලබා දී අත්හිටුවන ලද ස්ථානමාරු (මේ සමඟ ඇති **ඇමුණුම I (Annexure-I)** හි සඳහන් නිලධාරීන්ගේ ස්ථානමාරු) **2023.01.02** දින සිට ක්‍රියාත්මක කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. ඒ අනුව **ඇමුණුම I ( Annexure-I)** හි සඳහන් නිලධාරීන්, **2023.01.02** දින නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකි වන පරිදි මුදාහැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය.

03. දැනට සේවය කරනු ලබන ස්ථානයේ වසර හතරක (04) සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට මෙම වාර්ෂික ස්ථානමාරු වෙනුවෙන් ගමන් වියදම් හිමිකම් ලැබෙන්නේ එම නිලධාරීන්ගේ ඉල්ලීමකින් තොරව සේවා අවශ්‍යතාවය මත අදාල ස්ථාන මාරු නියෝග කර ඇත්නම් පමණි. දැනට සේවය කරනු ලබන ස්ථානයන්හි වසර හතරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව ගමන් වියදම් සඳහා හිමිකම් ලැබේ.

04. අදාල ස්ථාන මාරු නියෝග පරිදි මුදා හැරීමට නියමිත සියලුම නිලධාරීන් නියමිත දිනට මුදා හැරීමට කටයුතු කළ යුතු අතර එසේ මුදා හරින ලද බවට අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත දැන්විය යුතුය.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 නොවැම්බර් මස 17 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදිය.